**ශ්‍රම වාසනා අරමුදල - 2022**

**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රම වාසනා අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) 2019 අංක 15 දරන ශ්‍රම වාසනා අරමුදල (සංශෝධන) පනතින් සංශෝධිත 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනත** | | |
| (i) 3 . 3 උප වගන්තිය හා 3 . 4 . (2උ) උප වගන්තිය ප්‍රකාරව පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයට, එහි රැස්වීම්වල කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම්වල කටයුතු කරන ආකාරය විධිමත් කර ගැනීම සම්බන්ධව රීති සෑදීමට බලය ලබා දී තිබුණත් 2022 දෙසැම්බර් 31 දිනටත් එබඳු රීති පිළියෙල කර නොතිබුණි. කම්කරු කොමසාරිස් ජනරාල්වරයා, කම්කරු විනිශ්චය සභාවක්, බේරුම්කරුවෙකු හෝ කම්කරු උසාවියක් හෝ යම් අධිකරණයක් ඉදිරියේ ඇති නඩු කටයුතු සඳහා සේවා නියුක්තයන්ට නීතිමය සහාය ලබාගැනීමට, මූල්‍යමය සහන සැලසීමට තත්කාර්ය සඳහා සාදනු ලබන රීති මගින් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් මුදල් ප්‍රමාණයකට යටත් විය යුතු වුවත්, අදාල රීති 2022 දෙසැම්බර් 31 දිනටත් පිළියෙල කර නොතිබුණි. | ශ්‍රම වාසනා අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව රීති සෑදීමට අවශ්‍ය කෙටුම්පත් මේ වන විට කම්කරු අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර මේ වන විට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. වර්තමානයේදී ශ්‍රම වාසනා අරමුදල් පනත නැවත සංශෝධනයක් සිදු කිරීමට මේ වන විට සාකච්ඡා කරමින් සිටින අතර ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි රීති සෑදීමට අවශ්‍ය කෙටුම්පත් සහ පනත සංශෝධනය කිරීමට අවශ්‍ය කෙටුම්පත්ද එකවර සිදු කර ගැනීම සඳහා සාකච්ඡා කරමින් පවතී. | පනත ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ii) 13 . 1 උප වගන්තිය හා 13.2 (අ) උප වගන්තිය ප්‍රකාරව අරමුදල හා ලොතරැයි මණ්ඩලය එකඟවනු ලැබිය හැකි යම් ලොතරැයි සංඛ්‍යාවක් හා යම් ලොතරැයි වර්ග අරමුදල වෙනුවෙන් එක් එක් වර්ෂයේදී පවත්වනු ලැබිය යුතු වුවද, අරමුදල විසින් ජාතික ලොතරැයි මණ්ඩලය සමඟ එවැනි එකගතාවයකට | ලොතරැයි ගිවිසුමට අදාළ කරුණු සම්බන්ධව වසර ගණනාවක සිට ලොතරැයි මණ්ඩලය,මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා සිදු කළද නිසි පිළිතුරක් ලබා ගැනීමට නොහැකි විය. | පනතේ විධිවිධාන ප්‍රකාරව එකඟතාවයන්ට එළඹිය යුතුය. |

| | | |
|---|---|---|
| එළඹ නොතිබුණි. අරමුදල හා ලොතරැයි මණ්ඩලය අතර ඇති කර ගන්නා එකඟවීමට වෙනත් කරුණු අතර,<br><br>• එසේ පවත්වන ලොතරැයිවලදී ප්‍රදානය කරන තෑගි පිළිබඳව,<br><br>• ඒ ලොතරැයිවලදී හිමිකම් කියා නොසිටින තෑගි සම්බන්ධව කටයුතු කරන ආකාරය පිළිබඳව, සහ<br><br>• ලොතරැයිවලින් ලැබෙන මුදල්වලින් අරමුදල සඳහා වෙන්කල යුතු මුදල් ප්‍රමාණය පිළිබඳව විධිවිධාන ඇතුලත් විය යුතු වුවත්, අරමුදල හා ජාතික ලොතරැයි මණ්ඩලය සමඟ එවැනි එකඟතාවයන්ට එළඹ නොතිබුණි. | | |
| (iii) 14.1 උප වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කෙරෙහි බලපවත්වන හෝ ඊට සම්බන්ධ හෝ අනුෂංගික කාරණා සම්බන්ධයෙන් අවශ්‍ය යැයි මණ්ඩලය සලකන රීති හෝ මේ පනත මගින් රීති සෑදීමේදී බලය දී ඇති හෝ රීති සෑදීම අවශ්‍ය යැයි සලකන කාරණා සඳහා රීති මණ්ඩලය විසින් සාදනු ලැබිය හැකි වුවද 2022 දෙසැම්බර් 31 දින වන විටත් එබඳු රීති පිළියෙල කර අනුමත කරගෙන නොතිබුණි. | ශ්‍රම වාසනා අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව රීති සෑදීමට අවශ්‍ය කෙටුම්පත් මේ වන විට කම්කරු අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර මේ වන විට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.<br><br>වර්තමානයේදී ශ්‍රම වාසනා අරමුදල් පනත නැවත සංශෝධනයක් සිදු කිරීමට මේ වන විට සාකච්ඡා කරමින් සිටින අතර ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි රීති සෑදීමට අවශ්‍ය කෙටුම්පත් සහ පනත සංශෝධනය කිරීමට අවශ්‍ය කෙටුම්පත්ද එකවර සිදු කර ගැනීම සඳහා සාකච්ඡා කරමින් පවතී. | පනතේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (iv) 6 (ආ) වගන්තිය ප්‍රකාරව සේවා නියුක්තිකයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම්දීමකින් තොරව වසා දැමුණු අවස්ථාවක, ඒ සේවා නියුක්තිකයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම කලයුතු වුවත් 2022 දෙසැම්බර් 31 දිනට එබඳු මූල්‍ය හා වෙනත් අධාර සපයා නොතිබුණි. | සේවා නියුක්තිකයන් සේවයෙහි යෙදී සිටියදී ආයතන පූර්ව දැනුම්දීමකින් තොරව වසා දැමුණු අවස්ථා වලදී ඒ පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර තිබූ අතර 2022 අගෝස්තු 18 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම වැඩසටහන පුළුල් කර සිදු කිරීම සඳහා උපදෙස් ලබා දෙන ලදී. | පනතේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.12,927,981 අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,140,835 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.10,787,146 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මෙහෙයුම් ආදායම් සහ ස්ථාවර තැන්පතු පොළී ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යැපෙන්නන්ගේ සුභසාධන කටයුතු වෙනුවෙන් ඒකාබද්ධ අරමුදලින් සමාලෝචිත වර්ෂය සඳහා අයවිය යුතු රු.37,565,720 කින් රු.5,400,000 ක් පමණක් ලැබී තිබුණු අතර 2004 වසරේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ඒකාබද්ධ අරමුදලින් සුභසාධන කටයුතු සඳහා ලැබිය යුතු මුදල රු.378,809,164 ක් විය. ඒ අනුව භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් පරිදි මුදල් ලබාගත නොහැකි බැවින් සේවා නියුක්තිකයන්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුබසාධනය වෙනුවෙන් පනතේ දක්වා ඇති අරමුණු ඉටුකරගැනීමට නොහැකි වී තිබුණි. | රටේ පවතින මූල්‍ය අර්බුදය මත ශ්‍රම වාසනා අරමුදලට ජාතික ලොතරැයි මණ්ඩලය මඟින් මෙහෙයවනු ලබන ජාතික සම්පත ලොතරැයි ආදායම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ලැබී එම මුදල් ශ්‍රම වාසනා අරමුදල වෙත අරමුදලේ අයවැය අවශ්‍යතාවය අනුව, නිදහස් කරන අතර රටේ පවතින අයහපත් මූල්‍ය අර්බුදය හේතුවෙන් එලෙස ලැබෙන ප්‍රතිපාදන ශ්‍රම වාසනා අරමුදල විසින් අපේක්ෂා කරන මූල්‍යමය ඉල්ලීම් සඳහා අප වෙත වෙන් කර ඇති ප්‍රතිපාදන සීමා වී ඇත. | අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබාගෙන පනතේ අරමුණු ගත කාර්යයන් ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |